සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

**11 ශ්‍රේණිය** | **දෙවන වාර පරීක්ෂණය - 2024** | **84 | S | I,II**

නම: ..........................................  **ශිල්ප කලා - I**  **කාලය පැය තුනයි**

**උපදෙස් :-**
❖ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
❖ **අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති i, ii,iii,iv යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. ජනකලාවේ ශ්‍රව්‍ය දෘශ්‍ය කලා ප්‍රභේදයට අයත් කලාවන් කාණ්ඩය වනුයේ.
   i. පාරු කවි   ii. පිත්තල කර්මාන්තනය
   iii. කළගෙඩි නැටුම   iv. ස්වර්ණාභරණ කර්මාන්තය

02. ලන්දේසි ජාතිකයින්ගෙන් මෙරටට උරුම වූ බීරළු කර්මාන්තය වඩාත් ප්‍රචලිතව පවතින ප්‍රදේශය වන්නේ,
   i. මහනුවර   ii. ගාල්ල   iii. අම්පාර   iv. යාපනය

03. කෝණමානය කෝණ අගය මැනීමට යොදාගනී. කෝණමානය තුළ ඇතුළත් අංශක පරාසයන් වනුයේ,
   i. $0^0$ සිට $120^0$ දක්වා   ii. $0^0$ සිට $90^0$ දක්වා   iii. $10^0$ සිට $150^0$ දක්වා   iv. $0^0$ සිට $180^0$ දක්වා

04. කාර්මික ඇඳීමේදී සම්මත රේඛා භාවිතා කරනු දක්නට ලැබේ.  රූපයේ දැක්වෙන නිදහස් අතින් අඳින රේඛා භාවිතා වන අවස්ථා වන්නේ,
   i. සැඟි දාර දැන්වීමට.   ii. වස්තුවක පෙනෙන දාර දැක්වීම.
   iii. මධ්‍ය අගය දැක්වීමට.   iv. ඡේදනය වන ස්ථාන දැක්වීම.

05. රූපයේ දැක්වෙන රේඛා වර්ගය හඳුන්වනු ලබන්නේ,



   i. සමාන්තර රේඛා
   ii. සරල රේඛා
   iii. අක්වක් රේඛා
   iv. වක්‍ර රේඛා

06. රූපයේ දැක්වෙන වෘත්තය තුළ ඇති කොටස් හඳුන්වන නාමයන් වන්නේ,




   i. a - කේන්ද්‍රික ඛණ්ඩය   b - කේන්ද්‍රය   c - පරිධිය
   ii. a - කේන්ද්‍රික ඛණ්ඩය   b - පරිධිය   c - කේන්ද්‍රය
   iii. a - කේන්ද්‍රය   b - පරිධිය   c - කේන්ද්‍රික ඛණ්ඩය
   iv. a - විශ්කම්භය   b - අරය   c - කේන්ද්‍රය

07. රූපයේ දැක්වෙන ABC ත්‍රිකෝණය හඳුන්වනු ලබන්නේ,



   i. ඍජුකෝණී ත්‍රිකෝණය
   ii. සුලුකෝණී ත්‍රිකෝණය
   iii. මහාකෝණී ත්‍රිකෝණය
   iv. පරාවර්ථ කෝණය

08. කුහර සහිත ඇසුරුමක පවතින සියල්ලම එකම තලයක දිග හැරිය විට ලැබෙන තල රූපය හඳුන්වනු ලබන්නේ,
   i. විකසනය ලෙස ය.   ii. ත්‍රිමාණ රූප ලෙස ය.
   iii. සනරූප ලෙස ය.   iv. ජ්‍යාමිතික හැඩතල ලෙස ය.

09. සිලින්ඩරයක විකසනය නිර්මාණය කිරීමට අවශ්‍ය දත්ත වන්නේ,

i. පතුලේ විශ්කම්භය හා පරිධිය
ii. පරිධිය හා අරය
iii. සිලින්ඩරයේ උස හා පතුලේ විශ්කම්භය
iv. සිලින්ඩරයේ උස හා පරිධිය

10. ඕනෑම පාද ගණනක් ඇති සවිධි බහු අස්‍රයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය දත්තය කුමක් ද?

i. අරය　　ii. පාදයක දිග　　iii.කේන්ද්‍රය　　iv. පරිධිය

11. තාප බන්ධිත ක්‍රමයට රෙදි පිළි අලංකාර කිරීමෙන් ලැබෙන ප්‍රබල වාසියකි.

i. අලෙවිය පහසු වීම.
ii. අවශ්‍ය ආකාරයට තින්ත යොදා ගැනීමට හැකිවීම.
iii. නිර්මාණය සඳහා ගත වන කාලය වැඩිවීම.
iv. ඕනෑම පුද්ගලයෙකුට පහසුවෙන් නිර්මාණය කළ හැකි විම.

12. තිර රාමු මුද්‍රණ ක්‍රමයේදී උසස් මුද්‍රණ ක්‍රියාවලියක් සඳහා භාවිතා කරන රාමුවක පැවතිය යුතු ලක්ෂණකි.

i. රාමුව වෘත්තාකාර වීම　　ii. රාමුව මතුපිට රළු පෘෂ්ඨයක් තිබීම.
iii. රාමුවේ තිරය සඳහා කපු රෙදි යොදා ගැනීම.　　iv. රාමුවේ ශක්තිමත් සමතල සිනිඳු පෘෂ්ඨයක් තිබීම.

13. මූලික වර්ණ එකතු කිරීමෙන් ද්විතියික හා තෘතීක වර්ණ සකස් කල හැක. ද්විතියික වර්ණ ඇතුළත් වරණය තෝරන්න.

i. රතු, කහ, නිල්　　ii. තැඹිලි, රතු, රතු දම්　　iii. දම්, කොළ, තැඹිලි　　iv. සුදු, කළු, දුඹුරු

14. නිෂ්පාදිත රෙදි වල ස්වාභාවිකව හා බාහිරව එක්වූ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ,

i. පෙර පිරියම් කිරීම.　　ii. පසු පිරියම් කිරීම.　　iii. මල හරණය කිරීම.　　iv. විරංජනය කිරීම.

15. සායම් භාවිතයෙන් තොර රෙදි පිළි අලංකරණ ක්‍රමයක් වන්නේ,

i. අච්චු මුද්‍රණය　　ii. පැච් වර්ක් නිර්මාණය　　iii. සරල මුද්‍රණ ක්‍රම　　iv. සේද රාමු මුද්‍රණය

16.මල හරණ ක්‍රියාවලියේදී යොදා ගනු ලබන කෘත්‍රිම ක්ෂාලක ලෙස හඳුන්වනු ලබන්නේ,

i. බ්ලීචින් පවුඩර්　　ii. විනාකිරි　　iii. සිලිකා　　iv. සබන්

17. රෙදිපිළි සායම් කිරීම, ආලේප කිරීම, මුද්‍රණය කිරීම යන ක්‍රියාවලියෙන් පසු යොදනු ලබන පසු පිරියම් ක්‍රම යෙදීමෙන් බලාපොරොත්තු වනුයේ,

i. සායම් ගැල්වීම　　ii. සායම් ස්ථිර කිරීම　　iii. මුද්‍රණය පහසු කිරීම　　iv. සායම් කිරීම පහසු වීම.

18. ලෝම රෙදි වල අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ,

i. කාබනීකරණය　　ii. මැලියම්හරණය　　iii. විරංජනය　　iv. කැඳ හරණය

19. පින්සලේ ඇති කෙඳිවල ඝනකම අනුව පින්සල් අංක කරනු ලැබේ. අංක 00 සිට අංක 03 දක්වා අංක වලින් නම් කරන ලද පින්සල් හඳුන්වනු ලබන්නේ,

i. රවුම් පින්සල්　　ii. පැතලි පින්සල්　　iii. සියුම් නිමා පින්සල්　　iv. විශාල සේදුම් පින්සල්

20. රූපයේ දැක්වෙන ඉලිප්සය නිර්මාණය කිරීමේ ක්‍රමය හඳුන්වනු ලබන්නේ

i. සෘජුකෝණාස්‍ර ක්‍රමය
ii. චාප ක්‍රමය
iii. ඒක කේන්ද්‍රීය වෘත්ත ක්‍රමය
iv. සමමිතික ක්‍රමය



21. බතික් මුද්‍රණයේදී ඉටි මිශ්‍රණය සකසා ගැනීමට පැරපින් ඉටි, මී ඉටි, රට දුම්මල එකතු කල යුතු අනුපාතය පිළිවෙලින් දැක්වෙන්නේ,
   i. 4 : 2: 1 අනුපාතයට
   ii. 6 : 2: 1 අනුපාතයට
   iii. 8 : 4: 2 අනුපාතයට
   iv. 3 :2:1 අනුපාතයට

22. රෙද්දක වටිනාකම රඳා පවතින්නේ යොදනු ලබන නූල් වර්ග අනුවය. නූලක වටිනාකම තීරණය කරනු ලබන සාධකයකි.
   i. නූලක ඇඹරුම් ප්‍රමාණය
   ii. නූලක වර්ණය
   iii. නූලක වෙළඳ නාමය
   iv. නූල ඔතා ඇති ආකාරය

23. මෙට්‍රික් නූල් අංකය $25^{s}$ නූල් කිලෝග්‍රෑම් 5 ට ඇති නූල් කැරලි ගණන කීයද?
   i. නූල් කැරලි 125
   ii. නූල් කැරලි 150
   iii. නූල් කැරලි 50
   iv. නූල් කැරලි 250

24. අංක $20^{s}$ තනිපට නූලක් දෙපොට අඹරා ගත් විට එහි අංකය 2/ 20 s ඒ අනුව කිලෝග්‍රෑම් 1 කට තිබෙන නූල් (නූල් මල්) කැරලි ගණන කීයද?
   i. කැරලි 40 යි.
   ii. කැරලි 80 යි.
   iii. කැරලි 10 යි.
   iv. කැරලි 20 යි.

25. ජෝන් කේ විසින් ක්‍රි.ව 1773 දී නිපදවන ලද අත් යන්ත්‍රය හඳුන්වනු ලබන්නේ,
   i. මේස යන්ත්‍රය  ii. ජවනඩා යන්ත්‍රය  iii. චාම් යන්ත්‍රය  iv. බලවේග යන්ත්‍රය

26. හරස් නූල් තදකර ගැනීම, නූල් අවුල් නොවී කෙලින් තබා ගැනීම වැනි ක්‍රියාවන් සඳහා උපයෝගි කර ගන්නා යන්ත්‍රයේ ඇති යන්ත්‍ර කොටස වන්නේ,
   i. පුඩුවැල් පේළි  ii. පිළි කඳ  iii. උර කඳ  iv. පනාව

27. යන්ත්‍රගත කරන ලද නූල් හැදය විවීමට හරස් නූල් යෙදිය යුතු වේ. හරස් නූල් ඔතා ගනු ලබන්නේ,
   i. දික් නූල් කුරුවලටය  ii. හැඩ නූල් කුරු වලටය  iii. මල් චක්‍රයටය  iv. එතුම් කුරු වලටය

28. රූපයේ දැක්වෙන හිරි වියමන හඳුන්වනු ලබන්නේ



   i. සරල හිරි වියමන
   ii. රළ හිරි වියමන
   iii. රුවිත හිරි වියමන
   iv. තුඩු හිරි වියමන

29. මහා පරිමාණ කර්මාන්ත ශාලාවන්හි යන්ත්‍රානුසාරයෙන් මැටි පදම් කිරීමේදී රෝලර් ක්‍රෂර් යන්ත්‍රය මඟින් සිදු කරනුයේ
   i. වැඩි ජලය මැටි මිශ්‍රණයෙන් ඉවත් කිරීම.
   ii. මැටි වල ඇති වායු බුබුල් ඉවත් කෙරේ.
   iii. නොඇලෙන සුළු අමුද්‍රව්‍ය සියුම්ව කුඩු කරයි.
   iv. පදම් මැටි රෝල් වශයෙන් යන්ත්‍රයෙන් ඉවතට ලබා දෙයි.

30. මැටි භාණ්ඩ නිශ්පාදනයේදී යොදා ගන්නා නොඇලෙන සුලු අමුද්‍රව්‍යකි.
   i. ග්‍රෝග්  ii. කෙඔලීන්  iii. බෙන්තොනයිට්  iv. බෝල මැටි

31. මැටි වල පවතින සුවිකාර්යතාවය ලෙස හඳුන්වනු ලබන්නේ,
   i. ඇලෙන සුලු බව  ii. සිදුරු සහිත බව  iii. භාණ්ඩයේ පරිමාව අඩු වීම  iv. වර්ණවල තීව්‍රතාවය

32. මැටි දරණු මඟින් භාණ්ඩ තැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණකි.
   i. කඩතොළු රහිත භාණ්ඩ තැනීම.
   ii. දරණු ඇලවීමට බයින්ඩර් ගම් භාවිතා කිරීම.
   iii. දරණු සණව සකසා ගැනීම.
   iv. එක සමාන ඝනකම සහිත දරණු සකස් කිරීම.

33. පේපර් ක්විලින් නිර්මාණ කිරීමේ පියවර පහත දක්වේ. එම පියවරයන් පිලිවෙළින් දක්වෙන්නේ,

A- රෝල් කරගත් පටි හැඩගැන්වීම.
B - සමතල මතුපිටක තබා පෙති එකිනෙක ඇලවීම.
C- කඩදාසි පටි රෝල් කිරීම.
D - කඩදාසි තීරු කපා ගැනීම.
E - නිර්මාණය සැකසීම.

i. BADCE ii. DCBEA iii. DCABE iv. EDCAB

34. මූර්ති ගොඩනැගීමේ දී යොදා ගනු ලබන පූර්ණ උන්නත නැමැති ශිල්ප ක්‍රමයෙන් සිදු කරනුයේ,

i. මූර්තියෙන් අඩක් මතු වන ලෙස ගොඩනැගීම.
ii. මූර්තිය සම්පූර්ණයෙන් මතු කර දක්වීම.
iii. මූර්තිය මද වශයෙන් මතු කර දක්වීම.
iv. නිරමාණය මතු වන සේ සීරුම් රටා යෙදීම යි.

35. සිමෙන්ති මාධ්‍ය භාවිතයෙන් බිතු කැටයමක් නිර්මාණය කිරීමේදී සිමෙන්ති හා වැලි එක් කල යුතු අනුපාතය වන්නේ,
i. 4 : 1 ලෙස ය. ii. 1 : 2 ලෙස ය. iii. 1 : 3 ලෙස ය. iv. 2 : 2 ලෙස ය.

36. කඩදාසි පල්ප භාවිතයෙන් නිර්මාණ සිදු කිරීමේදී නිර්මාණ කල් තබා ගැනීම සඳහා පල්ප වලට එකතු කරනු ලබන්නේ,
i. ලින්සීඩ් ඔයිල් ii. පවුඩර් iii. බයින්ඩර් ගම් iv. වර්ණක

37. කඩදාසි ආශ්‍රිතව මැටි භාණ්ඩ අලංකාර කරනු ලබන ක්‍රමයකි.
i. මුද්‍රා ක්‍රමය ii. ඩෙකෝපාජ් ක්‍රමය iii. සායම් තුල ගිල්වීම iv. සායම් වැක්කිරීම.

38. මැටි භාණ්ඩ හම් පදම් අවස්ථාවේදී අලංකාර කිරීමට යොදා ගන්නා ක්‍රමයකි.
I. සායම් වැක්කිරීම ii. කැටයම් කිරීම iii. සායම් ඉසීම iv. අච්චු භාවිතය

39. මැටි භාණ්ඩ සකස් කළ පසු වියළීම කළ යුතුයි. ස්වාභාවික වියළන ක්‍රමයෙන් ලැබෙන අවාසියකි.

i. අමතර ඉන්ධන වැය නොවේ.
ii. භාණ්ඩයට හානි වීමට ඇති ඉඩ අඩු ය.
iii. විශාල අවකාශයක් අවශ්‍ය වේ.
iv. විශේෂ තාක්ෂණ දැනුමක් අවශ්‍ය නොවේ.

40. මැටි භාණ්ඩ නිශ්පාදනයෙන් පසුව ද්විතිතීක පිළිස්සීම ඇතැම් මැටි භාණ්ඩ සඳහා යොදා ගනු ලැබේ. මෙසේ ද්විතියික පිළිස්සීම සිදු කරනු ලබන්නේ,
i. මූලික පිළිස්සීම නොකළ බඳුන් වලට ය.
ii. අලුතින්ම සකස් කර වියළාගත් බඳුන්වලට ය.
iii. මූලික පිළිස්සීමට ලක් කරන ලද භාණ්ඩ වලට ය.
iv. භාවිතයෙන් පසු නැවත භාවිතා කළ බඳුන් වලට ය.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

| | | |
|---|---|---|
| **11 ශ්‍රේණිය** | **දෙවන වාර පරීක්ෂණය - 2024** | **84 S I,II** |

නම: .............................................

## ශිල්ප කලා - II

II කොටස

**✸ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 4 ක් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01. බෞද්ධාලෝක මහා විද්‍යාලයේ වාර්ෂිකව පවත්වනු ලබන මාධ්‍ය දින වැඩසටහනේ සියලු උත්සව සැරසිලි ඇඳුම් නිර්මාණ විද්‍යාලයේ ශිල්පකලා විෂය හදාරන සිසුන් වෙත පැවරී තිබුණි.

   i. සම්ප්‍රදායික පොල්තෙල් පහන වෙනුවට සිසුන් පොල්තෙල් පහනක් නිර්මාණය කර තිබුණි. එවැනි පොල් තෙල් පහනක් නිර්මාණය කිරීමට යොදා ගත හැකි ස්වාභාවික අමුද්‍රව්‍ය 4 ක් ලියන්න.
   ii. පිවිසුම් මාර්ගයේ ඉදිරිපස තොරණ අලංකාර වියමන් රටා භාවිතා කර අලංකාර කර තිබුණි. ඒ සඳහා යොදාගත හැකි වියමන් රටා දෙකක් නම් කරන්න.
   iii. උත්සව ශාලාව අලංකාර කිරීමට මැටි තහඩු භාවිතයෙන් සකසන ලද මල් බඳුන් යොදාගෙන තිබුණි. මැටි තහඩු භාවිතයෙන් සකස් කළ මැටි මල් බඳුනක රූප සටහනක් අඳින්න.
   iv. මාධ්‍ය ඒකකයේ සිසුන් හඳුනා ගැනීම සඳහා ලාංඡනයක් ලබා දීමට යෝජනා විය. ඒ සඳහා සුදුසු ලාංඡනයක් නිර්මාණය කරන්න.
   v. නිවේදිකාවන් සඳහා පින්තාරු කරන ලද සාරියක් සකසා අලංකාර කර ගෙන තිබුණි. සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමය සඳහා සුදුසු මල් මෝස්තරයක් අඳින්න.
   vi. කථන පුවරු අලංකාර කිරීම සඳහා විවිධ මල් යොදා ගෙන තිබුණි. කථන පුවරුව අලංකාර කර ගැනීමට යොදා ගතහැකි මල් වර්ග දෙකක් නම් කරන්න.
   vii. නැටුම් ඉදිරිපත් කිරීම කල සිසුවියන් පබළු භාවිතා කර පළඳනා සකසාගෙන තිබුණි. පබළු භාවිතයෙන් සැකසිය හැකි අභරණ දෙකක් නම් කරන්න.
   viii. උත්සව ශාලාව අලංකාර කිරීම සඳහා ජ්‍යාමිතික හැඩතල යොදාගෙන නිර්මාණය කර තිබුණි. නිර්මාණ සඳහා යොදා ගත හැකි ජ්‍යාමිතික හැඩතල 4 ක් නම් කරන්න.
   ix. ආරාධිතයින් සඳහා සමරු තිළිණයක් ලබා දීමට අපේක්ෂා කර තිබුණි. සමරු තිළිණ සැකසීමට යොදා ගත හැකි මාධ්‍ය 4 ක් ලියන්න.
   x. AB පාදයේ දිග 4 cm කි. BC පාදයේ දිග 3 cm කි. ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

02. ශිල්ප කලා විෂය හදාරණ ඔබට විවිධ නිර්මාණ සිදු කිරීමේදී ජ්‍යාමිතික හැඩතල අවශ්‍ය වේ.
   i. අරය 3 cm ක් වූ වෘත්තයක් ඇඳ එහි කේන්ද්‍රය හා පරිධිය නම් කරන්න.
   ii. පංචාස්‍රාකාර හැඩතලය යොදා ගනිමින් සිදු කල හැකි නිර්මාණ 6 ක් නම් කරන්න.
   iii. පාදයක දිග (A,B) 4 cm කි. පාදයක දිග දුන් විට ෂඩාස්‍රයක් ඇඳීමේ විශේෂ ක්‍රම භාවිතා කර ෂඩාස්‍රයක් නිර්මාණය කරන්න.

03. විවීම ආශ්‍රිත නිර්මාණ සඳහා පිරිවැය ගණනය කළ යුතුයි.

- අත් පිස්නා හැදයක දිග 60 m
- නූලේ අංකය $20^s$,
- පළල 40 cm
- 1cm ට දික්නූල් 40

   i. හැදයේ ඇති දික් නූල් සංඛ්‍යාව සොයන්න.
   ii. අත් පිස්නා විවීමට සුදුසු වියමන් රටා 3 ක් නම් කරන්න.
   iii. ඔබ නම් කරන ලද එක් වියමනක නූල් මතුවීම ප්‍රස්ථාරගත කර දක්වන්න.



04. විසිතුරු නිර්මාණ සඳහා විවිධ අමුද්‍රව්‍ය භාවිතා කරනු ලැබේ.

i. සැහැල්ලු සෙල්ලම් සතුන් නිර්මාණය කිරීම සඳහා යොදා ගන්නා රෙදි වර්ග 3 ක් ලියන්න.

ii. කෘත්‍රිම ආභරණ නිර්මාණය කිරීමට විවිධ මාධ්‍ය යොදා ගනී. කෘත්‍රිම ආභරණ භාවිතයේ වාසි 3 ක් ලියන්න.

iii. ඔබ කැමති මාධ්‍යයක් භාවිතයෙන් ගෙල පැළඳීමට සුදුසු මාලයක් සකස් කර ගන්නා ආකාරය විස්තර කරන්න.

05. විවිධ අමුද්‍රව්‍ය භාවිතයෙන් ගෘහ අභ්‍යන්තර අලංකරණ නිර්මාණ සිදු කරනු ලැබේ.

i. ගෘහ අභ්‍යන්තර අලංකරණය සඳහා යොදා ගන්නා රෙදි ආශ්‍රිත නිර්මාණ 4 ක් ලියන්න.

ii. රෙදි කැබලි ආශ්‍රිතව ඔබ කැමති සුරතල් සතෙකු නිර්මාණයට අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ ලැයිස්තුවක් සකස් කරන්න.

iii. වෘත්තාකාර හැඩය යොදා ගනිමින් කඩදාසි මලක් සාදා ගන්නා ආකාරය විස්තර කරන්න.

06. රෙදිපිළි අලංකරණය සඳහා විවිධ ක්‍රම ශිල්ප යොදා ගනී.

i. බතික් නිරමාණ වලදී මෝස්තර ලබා ගැනීමට රෙද්ද මත ඉටි තැවරීමේ ක්‍රම 4 ක් නම් කරන්න.

ii. සායම් භාවිතයෙන් පිළි අලංකාර කර ගන්නා ක්‍රම 3 ක් නම් කරන්න.

iii. බතික් මුද්‍රණය මඟින් සරමක් අලංකාර කර ගැනීමට සුදුසු මෝස්තරයක් අඳින්න.

07. ඈත අතීතයේ සිටම උද්‍යාන අලංකරණය ජනප්‍රිය අංගයක්ව පැවතුනි.

I. උද්‍යාණ අලංකරණ මූර්ති නිර්මාණය සඳහා භාවිතයට ගන්නා මාධ්‍ය 4 ක් නම් කරන්න.

ii. උද්‍යණ අලංකරණ නිර්මාණ කිරීමේදී ශිල්පීන් අවධානය යොමු කළ යුතු උද්‍යාන විද්‍යා මූලධර්ම 4ක් නම් කර කෙටියෙන් විස්තර කරන්න.

iii. පදම් මැටි භාවිතයෙන් විචිත්‍ර කැටයමක් නිර්මාණය කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.